SLGURU.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2026
Third Term Test - Grade 13 - 2026

සංගීතය (පෙරදිග) - I

54 S I

කාලය පැය 02 යි

නම/ විභාග අංකය:

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
* අංක 01 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට (i), (ii), (iii), (iv), (v) යන පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරාගෙන එයට හිමි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.
* 31 සිට 50 දක්වා ප්‍රශ්නවලට උත්තර පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

---

(01) කෝමල ගාන්ධාරය වක්‍ර ස්වරයක් ලෙස යෙදෙන නිර්දේශිත පූර්වාංග වාදී රාගය ඇතුළත් වරණය තෝරන්න.
(i) දේස් (ii) ජයජයවන්ති (iii) බාගේශ්‍රී
(iv) කාලිංගඩා (v) ආසාවරී (.....)

(02) රිෂභය හා පංචමය වාදී සංවාදී වන රාග තුනක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(i) දේස්, ආසාවරී, ජෞනපුරි (ii) තිලක්කාමෝද්, දේස්, ආසාවරී
(iii) ජයජයවන්ති, දේස්, ආසාවරී (iv) ජයජයවන්ති, දේස්, තිලක්කාමෝද්
(v) ජයජයවන්ති, තිලක්කාමෝද්, ආසාවරී (.....)

(03) සගමප, ධුප, ගමරිස යන ස්වර සංගතිය නිර්දේශිත රාගයක යෙදේ. එම රාගය පිළිබඳව දක්වා ඇති සත්‍ය ප්‍රකාශය ඇතුළත් පිළිතුර තෝරන්න.
(i) පරමේල ප්‍රවේශක රාගයක් වේ. (ii) උදය සන්ධි ප්‍රකාශ රාගයක් වේ.
(iii) සවස සන්ධි ප්‍රකාශ රාගයක් වේ. (iv) ඡායලග් රාගයක් වේ.
(v) පූර්වාංග වාදී රාගයක් වේ. (.....)

(04) නිර්දේශිත රාග අතරින් සමප්‍රකෘති රාග යුගලයක් ඇතුළත් වරණය තෝරන්න.
(i) දේස්, ආසාවරී (ii) තිලක්කාමෝද්, භෛරව
(iii) භෛරව, ආසාවරී (iv) තිලක්කාමෝද්, දේස්
(v) හංසධ්වනි, ජයජයවන්ති (.....)

(05) ස රි ගු ම ප ධ නි යන මේල ස්වරවලින් උපදින නිර්දේශිත රාගය ඇතුළත් පිළිතුර කුමක් ද?
(i) දේස් (ii) කාලිංගඩා (iii) භෛරව
(iv) ආසාවරී (v) බාගේශ්‍රී (.....)

(06) මධ්‍යමය සහ සඩ්ජය වාදී සහ සංවාදී ස්වර ලෙස යෙදෙන රාග යුගලය ඇතුළත් පිළිතුර කුමක් ද?
(i) මාලකෞන්ස් - ආසාවරී (ii) බාගේශ්‍රී - දේස්
(iii) බාගේශ්‍රී - මාලකෞන්ස් (iv) හංසධ්වනි - බාගේශ්‍රී
(v) ජයජයවන්ති - මාලකෞන්ස් (.....)

(07) රාගධාරී සිතාර් වාදනයක දී හෝ වයලින් වාදනයක දී යොදා **නොගන්නා** තානාලංකාර වර්ගය මින් කුමක් ද?
(i) බෝල්තාන (ii) සපට්තාන (iii) අලංකාරිකතාන
(iv) කූටතාන (v) මිශ්‍රතාන (.....)

(08) මධ්‍යමය හා ධෛවතය වර්ජිත, කර්ණාඨක සංගීත පද්ධතියට ආවේණික රාගයක් ඇතුළත් වරණය තෝරන්න.
(i) දේස් (ii) හංසධ්වනි (iii) ආසාවරී
(iv) බාගේශ්‍රී (v) කාලිංගඩා (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(09) දේස්-තිලක්කාමෝද්, කාලිංගඩා-හෙරව, ජෞනපුරි-ආසාවරී යන රාග යුගලයන් හි ඇති හින්දුස්ථානී රාග සංකල්පය මින් කුමක් ද?
(i) සන්ධි ප්‍රකාශ රාග වේ. (ii) පූර්වාංගවාදී රාග වේ.
(iii) සමප්‍රකෘති රාග වේ. (iv) උත්තරාංගවාදී රාග වේ.
(v) සම්පූර්ණ ජාති රාග වේ. (.....)

(10) 'ගමක' ස්වර අභ්‍යාසයකට සුදුසු ස්වර කණ්ඩය අයත් පිළිතුර තෝරන්න.
(i) ගරිසරිස (ii) ගමගිස (iii) ගමමරිප
(iv) ගගරිගගරිස (v) නිධනිනිස් (.....)

(11) | ක ධි ට ධි ට | ධ - | වශයෙන් ආරම්භ වන තාලය වයනු ලබන අවනද්ධ වාද්‍ය භාණ්ඩය සහ එම තාලයේ බලි ස්ථානයට හිමි විභාගයෙහි යෙදෙන අවනද්ධ අක්ෂර ඇතුළත් පිළිතුර කුමක් ද?
(i) පඛ්වාජ් - ධි ට ධ (ii) පඛ්වාජ් - ගෙ ති ට
(iii) ඩෝලය - ගෙ ති ට (iv) තබ්ලාව - ගෙ ති ට
(v) මද්දලය - ගෙ ධි ට (.....)

(12) එක් ආවර්ථයක් තුළ ගුද්ධිං යන අවනද්ධ අක්ෂර තෙවරක් වාදනය වන හින්දුස්ථානි තාලය මින් කුමක් ද?
(i) දීප්චන්දි තාලය (ii) තිලවඩා තාලය (iii) ඒක් තාලය
(iv) ඛෙම්ටෝ තාලය (v) පංජාබ් තාලය (.....)

(13) ශාස්ත්‍රීය තබ්ලා වාදනයක ඇතුළත් නොවන වාදන අංගය මින් කුමක් ද?
(i) ගත් (ii) ජලා (iii) පරන්
(iv) රේලා (v) තිහායි (.....)

(14) සුළු දෙමැදුම් තුන් තිතේ මාත්‍රා බෙදීම් පෙන්නුම් කරන පිළිතුර තෝරන්න.
(i) | 1̂ 2 | 1̂ 2 | 1́ 2 3 | (ii) | 1́ 2 | 1́ 2 | 1́ 2 | (iii) | 1̂ 2 | 1́ 2 3 | 1́ 2 3 |
(iv) | 1̂ 2 | 1́ 2 3 | 1́ 2 | (v) | 1́ 2 3 | 1́ 2 | 1́ 2 | (.....)

(15) ධ̲ධ̲ තිට̲ ධ+ ++ ධ̲ධ̲ තිට̲ ධ+ ++ ධ̲ධ̲ තිට̲/ ධ මෙම තිහායි කොටස එක් ආවර්ථයක් තුළ වාදනය කිරීමට සුදුසුම තාලය මින් කුමක් ද?
(i) දීප්චන්දි තාලය (ii) දාදරා තාලය (iii) ත්‍රීතාලය
(iv) ජප්තාලය (v) රූපක්තාලය (.....)

* **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති ස්වර පාදය ඇසුරින් පිළිතුරු සපයන්න.**

| ම ̊ග̲ ස | ග̲ - ස ම | සග̲ මග̲ මධ̲ | මධ̲ නිධ̲ නිසං̇ නිසං̇ |

(16) ඉහත ස්වර පාදයෙන් පිළිබිඹු වන රාගය වන්නේ,
(i) මාලකෞන්ස් (ii) ජයජයවන්ති (iii) බාගේශ්‍රී
(iv) දේස් (v) හංසධ්වනි (.....)

(17) එම ස්වර පාදය ප්‍රස්තාර කර ඇති හින්දුස්ථානි තාලය සහ ඊට සමාන දේශීය තිත ඇතුළත් පිළිතුර කුමක් ද?
(i) දීප්චන්දි - මැදුම් තනි තිත (ii) ජප් තාලය - මැදුම් මහ දෙතිත
(iii) ත්‍රීතාලය - සුළු මැදුම් දෙතිත (iv) තිලවඩා - මැදුම් මහ දෙතිත
(v) දීප්චන්දි - මැදුම් මහ දෙතිත (.....)

(18) මෙම ස්වර පාදයේ පළමු විභාගයේ කෝමල ගාන්ධාරයට ඉහළින් ඇති මධ්‍යමය (ම ස්වරය) මින් කුමක් ද?
(i) මීන්ඩ් ස්වරයකි. (ii) මුර්කි ස්වරයකි. (iii) කන් ස්වරයකි.
(iv) විවාදි ස්වරයකි. (v) ආන්දෝලිත ස්වරයකි. (.....)

(19) ඉහත ස්වර පාදයේ දෙවන විභාගයේ යෙදී ඇති රාගධාරී ශිල්පාංගය කුමක් ද?
(i) මූර්කි (ii) මීන්ඩ් (iii) ගමක්
(iv) කන් (v) විවාදී (.....)

(20) මෙම ස්වර පාදයේ අවසානයට යෙදී ඇති තානාලංකාරය නම් කළ හැකි සුදුසුම තානාලංකාර වර්ගය මින් කුමක් ද?
(i) සපට් තාන (ii) ගමක තාන
(iii) බෝල්තාන (iv) අලංකාරික තාන
(v) කූට තාන (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(21) චතුරංග නම් ගායන ශෛලියෙහි අඩංගු ගීත වර්ග පිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.
(i) ඛ්‍යාල්, තරාණා, සර්ගම්, තිර්වට්
(ii) ඛ්‍යාල්, සර්ගම්, තරාණා, තිර්වට්
(iii) ඛ්‍යාල්, ථුම්රි, සර්ගම්, තිර්වට්
(iv) තරාණා, ඛ්‍යාල්, සර්ගම්, තිර්වට්
(v) තිර්වට්, ඛ්‍යාල්, සර්ගම්, තරාණා (.....)

(22) ධෘපද් සහ ධමාර් යන ගායන ශෛලීන්වලට ඇතුළත් නොවන්නේ මින් කුමක් ද?
(i) ආලාප (ii) අන්තරා (iii) ස්ථායි
(iv) සංචාරී (v) තානාලංකාර (.....)

(23) භාරතීය සංගීතයේ වේද ගායනා අතර සංගීත ස්වර විකාශය හා සම්බන්ධ වේද ග්‍රන්ථය වන්නේ මින් කුමක් ද?
(i) සෘග්වේදය (ii) යජුර්වේදය (iii) සාමවේදය
(iv) අතර්වන්වේදය (v) ආයුර්වේදය (.....)

(24) කර්ණේන්ද්‍රිය තුළ ඇතුළත් නොවන අවයවය මින් කුමක් ද?
(i) මුද්ගරිකා අස්ථිකාව (ii) වෙස්ටිබියුලර් තන්තු (iii) කර්ණශංඛය
(iv) යුස්ටේකීය නාලය (v) වෙස්ටිබියුලර් ස්නායුව (.....)

(25) හෝවාර්ඩ් ගාඩ්නර් විසින් ඉදිරිපත් කළ බහුවිධ බුද්ධි න්‍යායට සම්බන්ධ නිපුණතා සංඛ්‍යාව ඇතුළත් පිළිතුර තෝරන්න.
(i) 5 (ii) 10 (iii) 12
(iv) 8 (v) 6 (.....)

(26) Brass පවුලට අයත් නොවන සංගීත භාණ්ඩයකි,
(i) ඕබෝ (ii) ට්‍රම්පට් (iii) ත්‍රොම්බෝන්
(iv) ටියුබා (v) ඉයුෆෝනියම් (.....)

(27) ජයදේව, සාරංගදේව සහ මාතංග යන පඬිවරුන් විසින් රචනා කළ ග්‍රන්ථ පිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.
(i) ගීත ගෝවින්දය, බෘහද්දේශි, සංගීත රත්නාකරය
(ii) ගීත ගෝවින්දය, සංගීත රත්නාකරය, බෘහද්දේශි
(iii) රාග තරංගණී, ගීත ගෝවින්දය, බෘහද්දේශි
(iv) බෘහද්දේශි, ගීත ගෝවින්දය, සංගීත රත්නාකරය
(v) සංගීත රත්නාකරය, ගීත ගෝවින්දය, බෘහද්දේශි (.....)

(28) දීර්ඝ යති සහිතව කාන්තාවන් විසින් ගයනු ලබන මෙහෙ ගී විශේෂය මින් කුමක් ද?
(i) වරම් ගී (ii) කමත් ගී (iii) නෙළුම් ගී
(iv) ගොයම් ගී (v) යාග ගී (.....)

(29) පැල් ගී, පතල් ගී, පාරු ගී, නැලවිලි ගී, බඹර ගී යන ගී වර්ග හතර සඳහාම පොදුවේ අදාළ වන නිවැරදි කියමන තෝරන්න.
(i) සියලුම ගී මෙහෙ ගී ගණයට අයත් වේ.
(ii) සියලුම ගී සමාජ ගී වේ.
(iii) සියලුම ගී ආඝාතාත්මකව ගැයේ.
(iv) සියලුම ගීත සාමූහිකව ගැයේ.
(v) සියලුම ගීත ඒකලව ගැයේ. (.....)

(30) අංගහාරය, ඉන්නිසය, තෝඩායම යන ගීතාංග ඇතුළත් රංග ශෛලිය මින් කුමක් ද?
(i) නූර්ති (ii) සොකරි (iii) කෝලම්
(iv) නාඩගම් (v) නවනාට්‍ය (.....)

* **අංක 31 සිට 50 දක්වා ප්‍රශ්නවල හිස් තැන් සඳහා සුදුසු ම පිළිතුර ලියන්න.**

(31) ධ නි ස රි ග ම ප ධ මෙම ස්වර අෂ්ඨකය .....ස්කේලයට අයත් වන අතර එය ..... ස්කේලයට ද සම්බන්ධතාවයක් දක්වයි.

(32) ලතින් ඇමරිකානු ජනප්‍රිය රිද්ම රටාවක් ලෙස ..... දැක්විය හැකි අතර, අප්‍රිකානු සංගීතයේ ඝන භාණ්ඩයකට සහ අවනද්ධ භාණ්ඩයකට උදාහරණ ලෙස ..... ගත හැකිය.

(33) මිනිස් සිරුර තුළ ශක්ති ස්ථාන ..... ඇත. එම ස්ථාන ..... නමින් හැඳින්වේ.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(34) | ග ප ග ස | ම ම ධ - | ප නි නි රි | ස̇ - - - | මෙම ස්වර ප්‍රස්ථාරයේ විභාග හතර සඳහා ..... යන කෝඩ් හතර ගැළපෙන අතර, C minor ස්කේලයට අයත් ස්වර ..... වේ.

(35) දීප්චන්දි සහ ධමාර් යන තාල දෙකෙහි ගති ලක්ෂණය ..... වන අතර ..... සමාන වේ.

(36) ශ්‍රී ලංකාවේ ජන සංගීතය සහ දේශීය තිත් තාල පද්ධතිය ගොඩනැගෙන ආකාරය පිළිබඳ ව පර්යේෂණාත්මක ග්‍රන්ථයක් ලෙස .....මහතා විසින් රචිත ..... නම් ග්‍රන්ථය දැක්විය හැකි ය.

(37) කෝලම් රංග සම්ප්‍රදායේ දී ..... බෙරය යොදාගන්නා අතර තාල වාදනය සඳහා ..... දෙකක් වාදනය කිරීම නාඩගම් රංග සම්ප්‍රදායේ විශේෂත්වයකි.

(38) Brass Wind ගණයට අදාළ සංගීත භාණ්ඩයක් ලෙස ..... හැඳින්විය හැකි අතර, Piccolo සහ Flute යන වාද්‍ය භාණ්ඩ ..... ඝනයට අයත් වේ.

(39)  මෙම සංකේතය ..... නමින් හඳුන්වන අතර, වයලීනය ..... හඬතලයට අයත් තත් වාද්‍ය භාණ්ඩයකි.

(40) 'පැජන්ට් ඔෆ් සිලෝන්' සංගීත වැඩසටහන ඉදිරිපත් කරමින් සංගීතයට විශාල මෙහෙයක් සිදුකළ සංගීතඥයකු ලෙස ..... මහතා හැඳින්විය හැකි අතර, සිංහල ඛ්‍යාල් ගීත රැසක් ඇතුළත් ..... ග්‍රන්ථය වින්සට් සෝමපාල මහතාගේ කෘතියකි.

(41) මහනුවර යුගයේ දී බෙර සහ සුෂිර වාද්‍ය භාණ්ඩවලින් සැදුණු පරිවාර වාද්‍ය කණ්ඩායම ..... අංශය නමින් හැඳින් වූ අතර රාජ සභාවට අයත් නැටුම් ගැයුම් පැවැත් වූ ස්ථානය ..... නම් විය.

(42) චිත්‍රපට සංගීතයේ යුග තුන ..... | ..... | ..... | දශක වශයෙන් සඳහන් වන අතර, විශාරද ගුණදාස කපුගේ මහතා විසින් ගයනු ලබන 'උන්මාද සිතුවම්' යන ගීතය ..... චිත්‍රපටයේ එන ගීතයකි.

(43) තත් ජිත් තොන් නන් ලෙස දෘත ලයෙන් ගැයෙන බෙර පදය .....ගායනා වල ඇතුළත් වන අතර, 'මොහු හැර වෙන දන් දෙන්නෝ' යන ගීතය ..... වැලපුම් ගීතයකි.

(44) සාම්ප්‍රදායික වැදි ගී නාදමාලා ඇසුරින් නිර්මාණය කරන ලද නූතන සරළ ගී ලෙස ..... හා ..... යන ගී දැක්විය හැකි ය.

(45) කිසියම් ස්කේලයක (Scale) ස්වර 12 පිළිවෙළින් පෙළගස්වා එහි 1 + 5 + 8 + 12 යන ස්වර එකවර වාදනයෙන් එම ස්කේලයෙහි ..... (Chord) කෝඩ් එක ද 1 + 4 + 8 + 11 එකවර වාදනයෙන් ..... (Chord) කෝඩ් එක ද නිර්මාණය වේ.

(46) වේද ගායනාවේ එන ආරම්භක නාද ස්ථාන තුන ..... අනුදත්ත ..... යනුවෙන් දක්වා ඇත.

(47) බටහිර සංගීත ස්වර ප්‍රස්ථාරයක ස්වර ඉතා අඩු හඬකින් ගායනය හෝ වාදනය කළ යුතු බව දැක්වීමට ..... සංකේතයන්, ඉතා වැඩි හඬකින් ගායනය හෝ වාදනය කළ යුතු බව දැක්වීමට ..... සංකේතයක් යොදනු ලැබේ.

(48) පණ්ඩිත් රවිශංකර් ශිල්පියාගේ සහය තබ්ලා වාදකයා වූ .....මහතා ජාත්‍යන්තර කීර්තියට පත් වාද්‍ය ශිල්පියෙකු වූ අතර, උස්තාද් ගුලාම් අලි, පන්කජ් උදාස්, ජග්ජිත් සිං අති දක්ෂ ..... ගීත ගායකයින් තිදෙනෙකි.

(49) උඩරට පළාතේ ගැටබෙරයත්, වන්නි ප්‍රදේශවල දවුලත් භාවිත කරන රංග සම්ප්‍රදාය ..... වන අතර, උත්තර භාරතීය සංගීත ආභාසය ලැබුයේ ..... රංග සම්ප්‍රදායයි.

(50) තබ්ලා වාදනයක හස්ත සාදන අභ්‍යාසවලට යොදාගැනෙන ආවර්ත 01 ක ට සීමාවන, ගුණ කරනු ලබන පද විශේෂය ..... නමින් හඳුන්වන අතර, නිශ්චිත පද කොටසක් තෙවරක් වාදනය කර සමස්ථානයට පැමිණීම ..... නම් වේ.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2026
Third Term Test - Grade 13 - 2026

සංගීතය (පෙරදිග) - II

54 S II

කාලය පැය 03 යි

නම/ විභාග අංකය:

අමතර කියවීම් කාලය: මිනිත්තු 10 යි.

- (I) කොටසින් ප්‍රශ්න දෙකකට ද, (II) කොටසින් එක් ප්‍රශ්නයක්ද, (III) කොටසින් ප්‍රශ්න දෙකකට ද වශයෙන් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. (සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් හිමිවේ.)

I කොටස

(01) පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග තුනකට අයත් ස්වර සංගතීන් ය.

A - රි ම ප , නි ධ ප , ම ග රි , ග ස

B - ග ම ප , නි ධ ප , මග රිගු රිස

C - ගු ම , ධ නි ධ , ම ප ධ ගු , ම ගු රි ස

(i) ඉහත රාග තුන හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමග පිළිවෙළින් නම් කරන්න. (ල. 03)

(ii) එම රාග තුනෙන් කැමති එක් රාගයකට අදාළ බ්‍යාල් මධ්‍යලය ගීතයෙහි හෝ වාදිතයෙහි ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 08)

(iii) ඉහත (ii) කොටසට තෝරා නොගත් රාග දෙකින් එකකට අදාළව මාත්‍රා 16 කට නොඅඩු වන සේ තානාලංකාර දෙකක් තාලානුකූල ව ලියා දක්වන්න. (ල. 04)

(iv) ඉහත රාග තුන අතරින් එකම මේලයට අයත් රාග දෙක නම් කර, එම මේලයෙහි නම ද සමගින් මේල ස්වර ලියන්න. (ල. 05)

(02) (i) පහත දී ඇති එක් එක් ලක්ෂණ මගින් පිළිබිඹු වන රාගවල නම්, අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමග ලියා දක්වන්න. (ල. 03)

A - ප෣නිසරිගස, රිපමග, සරිග, සනි෣ වශයෙන් මුඛ්‍යාංගය යෙදෙන රාගයකි.

B - ධ , ගු වාදී සංවාදී ලෙස යෙදෙන ෂාඩව සම්පූර්ණ ජාති රාගයකි.

C - රි ම ප නි ධ ප ලෙස මුඛ්‍යාංගය යෙදෙන, දිනයේ දෙවන ප්‍රහරයේ ගැයෙන රාගයකි.

(ii) ඉහත රාග අතුරෙන් එක් රාගයකට අදාළ මධ්‍යලය බ්‍යාල් ගීතයක හෝ වාදිතයක හෝ ස්ථායි කොටස තාල සංකේත ද සහිතව ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 08)

(iii) ඉහත රාග තුන අතරින් සමප්‍රකෘති වන රාග යුගලය නම්කර, කරුණු 4 ක් ඇසුරින් එම රාග දෙක සංසන්දනය කරන්න. (ල. 06)

(iv) ඉහත B රාගයෙහි මේලය නම්කර, එම මේලයට අයත් මේල ස්වර ලියා දක්වන්න. (ල. 03)

(03) පහත A, B, සහ C අක්ෂරවලින් දැක්වෙනුයේ නිර්දේශිත රාග තුනකට අයත් පල්ටා තුනකි.

A

ගමරිස, නි෣ස
ගමරිස, නි෣සගම, ධප
ගමරිස, නි෣සගම, ධනිධපමප
ගමරිස, නි෣සගම, ධනිස්නිධපමප

B

ගප, ගගරිස
ගප නිපගප ගග රිස
ගප නිස්, නිපගප, ගගරිස
ගප නිස්, රිස්නිස්, නිපගප, ගගරිස

C

ගමගරිස
ගමප, ගමග, මගරිස
ගම පධ පම, ගම ගරිස
ගම පධ නිධ පම, ගම ගරිස
ගම පධ නිස් නිධ පම ගම ගරිස

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

(i) ඉහත පල්ටා තුනෙන් පිළිබිඹු වන රාග හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සමග රාගයේ නම ලියන්න. (ල. 03)

(ii) එම රාග තුනෙන් කැමති රාගයකට අදාළ බ්‍යාල් මධ්‍යලය ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටස තාල සංකේත ද සහිතව ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 08)

(iii) A හෝ B යන රාග දෙකින් එකකට අයත් මාත්‍රා 16 කට නො අඩු තානාලංකාර දෙකක් තාලානුකූල ව ලියන්න. (ල. 04)

(iv) දීප්චන්දි තාලයෙහි යේකාව නියමිත තාල සංකේත ද සහිතව සම ලයෙන් සහ දෙගුණ ලයෙන් ප්‍රස්තාර කරන්න. (ල. 05)

II කොටස

(04) (i) ශ්‍රී ලාංකීය සංගීත ගමන්මගෙහි මහනුවර යුගය සඳහා විශේෂ ස්ථානයක් හිමිවේ. ඒ පිළිබඳ ව පහත කරුණු ඔස්සේ විස්තරයක් ඉදිරිපත් කරන්න.

* දකුණු ඉන්දියානු බලපෑම
* රාජ සභා සංගීත හා නැටුම් ආයතන
* යොදාගත් සංගීත භාණ්ඩ
* බිහි වූ දේශීය ගායනා විශේෂ (ල. 08)

(ii) ''ගැමි ගී තුළින් ගැමි සමාජයේ සාමූහික බව දනවන අවස්ථා මෙන්ම, දාර්ශනික බව පෙන්නුම් කෙරෙන අවස්ථා ද දැකිය හැකිය.'' උදාහරණ දක්වමින් මෙම කරුණු පිළිබඳ ව කෙටියෙන් හඳුන්වන්න. (ල. 06)

(iii) ප්‍රශස්ති හා වන්නම් පිළිබඳ ව කරුණු හතරක් ඇසුරින් සංසන්දනය කරන්න. (ල. 04)

(iv) වැළපුම් ගිතයක පළමු පාදය ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 02)


(05) (i) නූර්ති සහ නාඩගම් රංග ශෛලීන්වල සංගීතමය ලක්ෂණ ඇසුරින් කරුණු හතරක් පිළිබඳ ව සංසන්දනය කරන්න. (ල. 08)

(ii) සොකරි සහ කෝලම් රංග ශෛලීන් දෙකෙහි සංගීතමය ලක්ෂණ තුන බැගින් ලියන්න. (ල. 06)

(iii) උඩරට සහ පහතරට සම්ප්‍රදායන්ට අයත් ශාන්තිකර්ම ගීත පිළිබඳව කරුණු තුන බැගින් ලියන්න. (ල. 06)

III කොටස

(06) (i) පහත දැක්වෙන අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට පෙරලා ප්‍රස්තාර කරන්න. (ල. 08)



(ii) ඉහත ප්‍රස්තාරයේ 1 සිට 6 දක්වා අංකනය කර ඇති සංකේත හයෙන් කැමති හතරක් නම්කර කෙටියෙන් හඳුන්වන්න. (ල. 08)

(iii) අපරදිග සංගීත ප්‍රස්තාරවල එන පහත සඳහන් ප්‍රකාශිත සංකේතවලින් දෙකක සංකේතය අඳිමින් කෙටියෙන් හඳුන්වන්න.

Pianissimo (පියානිසිමෝ) Forte (ෆෝටේ)

Piano (පියානෝ) Fortissiomo (ෆෝටිසිමෝ)

(ල. 04)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(07) (i) පහත වගුවෙහි (i) සිට (viii) දක්වා එක් එක් හිස්තැනට සුදුසු පිළිතුර අදාළ අංකය ද සමග ලියා දක්වන්න. (ල. 1 x 8 = 08)

සංගීත අධ්‍යක්ෂවරයා	චිත්‍රපටල	ගීතය
ආර්. මුත්තුසාමි	(i)	සිරිනි සරුසර වීලා
මොහොමඩ් ගවුස්	අශෝකමාලා	(ii) .....
(iii)	සුජාතා	මනරංජන දර්ශනීය ලංකා
බී. ඇස්. පෙරේරා	පෙරකදෝරු බෑනා	(iv) .....
සුනිල් ශාන්ත	(v)	(vi) .....
(vii)	(viii)	සිනිඳු සුදුමුතු තලාවේ

(ii) ''සත් සමුදුර චිත්‍රපටයේ සංගීතය වඩාත් සිනමාරූපී සංගීතයකි.'' මෙම අදහස චිත්‍රපටියේ සංගීත නිර්මාණය තුළින් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 08)

(iii) සිංහල බසින් රචිත සරල ශාස්ත්‍රීය ගීතයක් නම් කර එහි ඇතුළත් ශාස්ත්‍රීය ලක්ෂණ පිළිබඳ උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ල. 04)

(08) පහත ප්‍රශ්න අතුරෙන් හතරක් තෝරා පිළිතුරු සපයන්න.

(i) පෙරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණය සඳහන් කර, කැමති එක් ස්වර වාද්‍ය භාණ්ඩයක දළ රූප සටහනක් ඇඳ එහි ශුද්ධ ස්වර සප්තකය පිහිටන ආකාරය ලකුණු කර දක්වන්න.

(ii) බැලේ (Ballet) හෝ ඔපෙරා (Opera) පිළිබඳව පහත දැක්වෙන කරුණු යටතේ විස්තර කරන්න.

(a) මූලික ස්වභාවයන්

(b) සංගීත භාවිතය

(c) නිර්මාණකරුවන් හා නිර්මාණ

(iii) බහුවිධ බුද්ධ න්‍යාය සහ එහි සංගීත විෂයට ඇති සම්බන්ධය පැහැදිලි කරන්න.

(iv) පහත කරුණුවලින් එකක් පිළිබඳ උදාහරණ දක්වමින් කෙටියෙන් හඳුන්වන්න.

(a) ගාන සමය

(b) හාර්මනි (Harmony)

(c) Wind Instruments

(v) තබ්ලා වාදනයක ඇතුළත් අංග දෙකක් නම් කර, උදාහරණ ද සමගින් ඒ පිළිබඳ පැහැදිලි කරන්න.

(vi) '' සංගීතය විෂය හදාරන්නෙකුට ස්වරාලය සහ කර්ණේන්ද්‍රිය යන ඉන්ද්‍රියයන් ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳ අවබෝධය ප්‍රයෝජනවත් වේ.''

ස්වරාලය හෝ කර්ණේන්ද්‍රිය යන ඉන්ද්‍රියයන් දෙකින් එකක ක්‍රියාකාරිත්වය පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.

(ල. 5 x 4 = 20)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

“The roots of education are bitter, but the fruit is sweet.” — Aristotle (commonly attributed)

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

පිළිතුරු පත්‍රය - I කොටස

1 -(ii) 2 -(iv) 3 -(ii) 4 -(iv) 5 -(v) 6 -(iii) 7 -(i) 8 -(ii) 9 -(iii) 10 -(iv)
11 -(ii) 12 -(v) 13 -(ii) 14 -(iii) 15 -(iv) 16 -(i) 17 -(v) 18 -(iii) 19 -(ii) 20 -(iv)
21 -(i) 22 -(v) 23 -(iii) 24 -(ii) 25 -(iv) 26 -(i) 27 -(ii) 28 -(iii) 29 -(v) 30 -(iv)

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

(31) A minor scale / C major
(32) Salsa / Ramba / Samba
ජෙම්බෙ - කොංගො ආදි වශයෙන්
(33) 7 ක් / චක්‍ර
(34) C / F / G/ C / ස රි ගු ම ප ධු නි ඃ
(35) අසමාන / මිතිය
(36) ඩබ්. බී. මකුලොලුව / හෙල ගී මඟ
(37) පහතරට යක්බෙරය / මද්දල
(38) ට්‍රම්පට්, ඉයුපෝනියම්, ත්‍රොම්බෝන්, ප්‍රෙන්ච්හෝන් / Wood Wind
(39) Alto Clef / Soprano (සෝප්‍රානෝ)
(40) ලයනල් එදිරිසිංහ / භාවික ගීත
(41) තඹුරුපුරම්පෙට්ටුකාර / කවිකාර මඩුව
(42) 1947 / 1957 / 1967 / උදුම්බරා
(43) ගණපති සවුදම / අනාඝාතාත්මක
(44) නංගිට බැඳපු මල් වියනයි / කොටා දමඤ්ඤං මර මර
(45) Major Seventh / Minor Seventh
(46) උදත්ත / අනුදත්ත
(47) $\overset{1}{\text{Ä}}$ / Ä
(48) උස්තාද් අල්ලාරක්ඛා / ගzසල්
(49) සොකරි / නූර්ති
(50) කායදා / තිහායි

පිළිතුරු පත්‍රය - II කොටස

(01) (i) A - දේස් රාගය B - ජයජයවන්ති රාගය C - බාගේශ්‍රී රාගය (ල. 03)
(ii) බ්‍යාල් මධ්‍යලය ගීතය හෝ වාදිතයට (ල. 08)
(iii) රාගය නම්කර තානාලංකාර දෙකක් ලිවීමට (ල. 04)
(iv) දෙස්, ජයජයවන්ති ලෙස නම් කර ඛමාජ් - ස රි ග ම ප ධ නි ලෙස ලිවීමට (ල. 05)

(02) (i) A - තිලක්කාමෝද් රාගය B - ජෞනපුරි රාගය C - ආසාවරී රාගය (ල. 03)
(ii) මධ්‍යලය ගීතය වාදිතය ස්වර ප්‍රස්තාර කිරීමට (ල. 08)
(iii) ආසාවරී - ජෞනපුරි ලෙස නම්කර කරුණු හතරක් සන්සන්දනය කිරීමට (ල. 06)
(iv) B - ආසාවරී මේලය (මේල ස්වර - ස රි ගු ම ප ධු නි) (ල. 03)

(03) (i) A - භෛරව රාගය B - හංසධ්වනි රාගය C - කාලිංගඩා රාගය (ල. 03)
(ii) බ්‍යාල් මධ්‍යලය ගීතය / වාදිතය ප්‍රස්තාර කිරීම (ල. 08)
(iii) තානාලංකාර දෙකක් නිවැරදිව ලිවීම. (ල. 04)
(iv) දීප්චන්දි තාලය ප්‍රස්තාර කිරීමට (ල. 05)

(04) (i) කරුණු 4 ඔස්සේ විස්තර කිරීමට (ල. 08)
(ii) උදාහරණ සහිතව පිළිතුර ලිවීමට (ල. 06)
(iii) ප්‍රශස්ති වන්නම් සංසන්දනයට (ල. 04)
(iv) පළමු පාදය ගීත ස්වර ප්‍රස්තාර කිරීමට (ල. 02)

(05) (i) නූර්ති නාඩගම්වල සංගීතමය කරුණු සංසන්දනයට (ල. 08)
(ii) සොකරි, කෝලම්වල සංගීතමය ලක්ෂණ ලිවීමට (ල. 06)
(iii) උඩරට, පහතරට ශාන්තිකර්ම ගීත පිළිබඳ ලිවීමට (ල. 06)

(06) (i) | + + ස රි | ග මු්‍ර ප ධ්‍ර | ධ්‍රනි සි්‍රි සි්‍රනි ධ්‍ර | + ප - ම |
| - - ග රි | ස - - - | ස - - ග | මු්‍ර මු්‍ර රි ස | (ල. 08)
(ii) 1. ටයිම් සිග්නේචර් 2. මිනිම් රෙස්ට් 3. ක්වෙවර් 4. ක්‍රොචට් රෙස්ට්
5. ටයි 6. ඩොටඩ් මිනිම් ලෙස නම්කර, 4 ක් කැටියෙන් හැඳින්වීමට (ල. 08)
(iii) Pianissimo - $\overset{1}{\text{}}$ Forte - f Piano - p Fortissimo - Ä
සංකේත දෙකක් ඇඳ කෙටියෙන් හැඳින්වීමට (ල. 04)

(07) (i) i. මාතලන් ii. ශාන්ත මේ රාත්‍රියේ / පිපී පිපී රේණු නටන iii. ආනන්ද සමරකෝන්
iv. ආදර නදිය ගලා v. රේඛාව vi. ඕලු නෙළුම් / වෙසක් කැකුළු
vii. සෝමදාස ඇල්විටිගල viii. සත් සමුදුර (ල. 1 x 8 = 08)
(ii) නිවැරදි පිළිතුරට (ල. 08)
(iii) ගීතයක් නම්කර විස්තර කිරීමට (ල. 04)

(08) එක් පිළිතුරකට ලකුණු 5 බැගින් ප්‍රශ්න 4 ට ල. 20 යි. (ල. 5 x 4 = 20)

SLGURU.LK
For Educational Purpose Only